# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

වෙළුම 01 | මංගල කලාපය 01 | ඔක්තෝම්බර් 2005


# උක් වගාවේ සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝග වාහක කෘමියා හඳුනා ගනී



රෝග වාහක රෙසීලියා විශේෂය
(විශාල කළ ඡායා රූපයක්)

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයට බලවත් තර්ජනයක් වී ඇති පයිටොප්ලාස්මා විශේෂයක් මගින් ඇතිවන උක් වගාවේ සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝගය (GSD/WLD) පතුරුවන කෘමියා හඳුනා ගැනීමට වසර 3 1/2 ක් පමණ ඒ සම්බන්ධව පර්යේෂණ වල නියැලුනු උඩවලව උක් පර්යේෂණ ආයතනයේ පළිබෝධ පාලනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ජේ. ඒ. යූ. ටී. සෙනෙවිරත්න මහතා සමත් වී සිටී. ඒ අනුව මෙම පයිටොප්ලාස්මා විශේෂය පැතිරවීමට (ද්විතීක ආසාධනය) දායක වන කෘමියා පත්‍ර කීඩෑ ගණයට අයත් ප්‍රමාණයෙන් මි.මී. 3-4 පමණ වන රෙසීලියා විශේෂයක් (Recilia species) බව සනාථ කර ඇත.

මෙම පර්යේෂණ වලදී රෝගී උක් වගාවන් ආශ්‍රිතව සිටින කෘමි විශේෂ 50ක් පමණ ජාන තාක්ෂණය (පී. සී. ආර් තාක්ෂණික ක්‍රමය) හා සම්ප්‍රදායික සම්ප්‍රේෂණ තාක්ෂණ ක්‍රම භාවිතයෙන් දිගු කාලයක් තුල අධ්‍යයනයට ලක් කර ඇත.

1991 දී පමණ කන්තලේ ප්‍රදේශයේ වාර්තා වූ මෙම රෝගය 1995 න් පසු සියඹලාණ්ඩුව ප්‍රදේශයේ වසංගත තත්වයෙන් ව්‍යාප්ත විය. පසුව හිඟුරාන. පැල්වත්ත හා සෙවනගල ඇතුලු සියළුම උක් වගා කරන ප්‍රදේශ වලටද පැතිරී ගිය රෝගය උක් කර්මාන්තයට ප්‍රබල තර්ජනයක් බවට පත්විය. රෝගය වැළඳුන වගාවන් වල උක් අස්වැන්න හා උක් ගස්වල සීනි ප්‍රතිශතය ඉතා විශාල වශයෙන් අඩුවීමත්, ශීඝ්‍ර ලෙස මෙම රෝගය ව්‍යාප්ත වීමත් හේතුවෙන් අද වන විට උක් ගොවීන් හා සීනි කර්මාන්තායතන විශාල ප්‍රශ්නයකට මුහුණ දී සිටී.

රෝග කාරක පයිටොප්ලාස්මා ආසාධිත උක් දඬු කැබලි සිටුවීම මගින් ප්‍රාථමිකව මෙම රෝගය ව්‍යාප්ත වන බව දැන සිටියත් ද්විතීක සම්ප්‍රේෂණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැතිවීම පසුගිය කාලයේ උක් පර්යේෂණ ආයතනය හා සීනි කර්මාන්තායතන විසින් දියත් කරන ලද රෝග පාලන වැඩසටහනට බාධාවක්ව පැවතුණී.

රෝගය පතුරුවන කෘමියා හඳුනා ගැනීම හා එම කෘමි විශේෂයේ ජීවන චක්‍රය පිළිබඳව දැනුම ඉදිරි රෝග මර්දන කටයුතු සඳහා යොදා ගැනීම මගින් මෙම රෝගය පාලන වැඩසටහන සාර්ථක කර ගැනීමට හැකිවනු ඇත. එසේම රෝග ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනා ගැනීමේ පර්යේෂණ සඳහාද මෙම සොයා ගැනීම මනා පිටුවහලක් වනු ඇත.



නිරෝගි උක් පැළයක් සහිත බඳුනකට රෝග වාහක කෘමීන් ඇතුලු කර පරීක්ෂා කිරිම

## ඇතුලත පිටු


- උක් කර්මාන්ත තොරතුරු
  - එස්.එල්. 8306 ව්‍යාප්තිය වැඩිවේ
- පර්යේෂණ හා ව්‍යාප්ති තොරතුරු
  - නව උක් ප්‍රභේද ජනප්‍රිය කරවීමට පියවර
  - අඩු වියදම් උණුදිය ප්‍රතිකාර යන්ත්‍රයක්
- උක් වගාවේ සුදු පත්‍ර/ තෘණාකාර රෝග පාලනයට නිර්දේශිත ක්‍රියා මාර්ග යළි අවධාරණයට
- මැදමුලන පොල් තවාන් භූමියේ පැවති උක් පර්යේෂණ ආයතන ප්‍රදර්ශණ කුටියේ විවිධ අවස්ථා
- සීනි නිශ්පාදනය පිළිබඳ වර්තමාන තොරතුරු
- ආයතන තොරතුරු
- ස්ටීවියා (Stevia) 21 වන සියවසේ සීනි පැළෑටිය
- පොල් වගාවන් තුලට උක් වගාව

## උක් කර්මාන්ත තොරතුරු

# එස් එල් 8306 උක් ප්‍රභේදයේ ව්‍යාප්තිය වැඩිවේ



උක් පර්යේෂණ ආයතනය විසින් අභිජනනය කර 1992 වර්ෂයේදී වගා කිරීම සඳහා නිර්දේශ කළ එස් එල් 83-06 වැඩි වශයෙන් තම කේන්ද්‍රීය වගාවන් වල මෙන්ම තවාන් සඳහා ද භාවිතා කිරීම මගින් ජනාවාස හා පිටස්තර ගොවි ප්‍රදේශ තුළ සීඝ්‍ර ලෙස ව්‍යාප්ත කිරීමට උක් කර්මාන්තායතන පියවර ගෙන ඇති බව වාර්තාවේ. පැල්වත්ත උක් කර්මාන්තායතනය පසුගිය දෙවසර තුල හෙක්ටයාර 400 ක් පමණ තම කේන්ද්‍රීය වගාවන් සඳහා එස් එල් 8306 වගාකර ඇති අතර සෙවනගල උක් කර්මාන්තායතනය ද තම වගාවන් සඳහා හෙක්ටයාර 4ක් පමණ මෙම වර්ගය භාවිතා කර ඇත.

එසේම මෙම කර්මාන්තායතන දෙකම ඉදිරියේදී ජනාවාස හා පිටස්තර ගොවීන් සඳහා බීජ උක් ලෙස එස් එල් 8306 ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් පවතී.

සුදුපත්‍ර/ තෘණාකාර කුරුවීමේ රෝගයට අඩු පාත්‍රීතාව සහිත, ඉහළ සීනි අස්වැන්නක් ලබා දෙන මෙම උක් ප්‍රභේදය 1992 දී උක් පර්යේෂණ ආයතනය විසින් වර්ෂාපෝෂිත තත්ව යටතේ වගා කිරීමට හඳුන්වා දුන් නමුත් විවිධ හේතූන් මත උක් කර්මාන්තායතන විසින් තම වගාවන් සඳහා යොදා ගැනීමට අඩු නැඹුරුවක් පැවතිනි. නමුත් මෙම උක් ප්‍රභේදය සුදුපත්‍ර/ තෘණාකාර කුරුවීමේ රෝග වලට අඩු පාත්‍රීතාවයක් දක්වන බැවින් පසුගිය වසර කිහිපය තුළ උක් පර්යේෂණ ආයතනය විසින් බීජ උක් සැපයීම හා ව්‍යාප්ති කටයුතු මගින් එය ප්‍රචලිත කිරීමට ගත් සාර්ථක පියවර හේතුවෙන් සියඹලාණ්ඩුව ප්‍රදේශයේ අක්කර 1500ක් පමණ ප්‍රදේශයකට මෙම උක් ප්‍රභේදය ව්‍යාප්ත කිරීමට හැකිවූ අතර එහිදී එම ප්‍රදේශයේ බහුලව පැවති සුදුපත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝග තත්වයට ඔරොත්තු දෙමින් සාර්ථක වීම උක් කර්මානතායතන තුළ මෙම වර්ගයට විශාල ඉල්ලුමක් ඇති කිරීමට හේතු වී ඇත.

←එස් එල් 83-06 උක් ප්‍රභේදය

## පර්යේෂණ හා ව්‍යාප්ති තොරතුරු

**එස් එල් 92-49 18 හා**

**එස් එල් 92-4997**

**උක් ප්‍රභේදයන්ට ගොවීන්ගේ වැඩි කැමැත්තක්**

උක් පර්යේෂණ ආයතනය විසින් මෑතකදී හඳුන්වාදුන් උක් ප්‍රභේද ජනප්‍රිය කරවීම හා ඉදිරියේදී හඳුන්වා දීමට යෝග්‍ය ලක්ෂණ පෙන්වන උක් ප්‍රභේද ගොවීනට ආදර්ශනය කිරීමට හා ඒ පිළිබඳ ගොවීන්ගේ ආකල්ප හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර දින දෙකක් පසු ගිය දිනවල උඩවලව උක් පර්යේෂණ ආයතනයේදී පැවැත්විණ. මෙහිදී එස් එල් 83-06, එස් එල්. 86-13, එස් එල්. 88-116 ප්‍රභේද ආදී දැනට නිර්දේශ කර ඇති වර්ග මෙන්ම එස් එල් 92-4918 එස්. එල් 92-4997 ආදී ඉදිරියේදී හඳුන්වා දීමට යෝග්‍ය ලක්ෂණ පෙන්වන උක් ප්‍රභේද ක්ෂේත්‍ර ආදර්ශන සඳහා භාවිතා කෙරුණි. මේ සඳහා සෙවනගල ප්‍රදේශයේ තෝරාගත් ගොවි මහත්ම මහත්මීන් 50ක් පමණ හා සෙවනගල උක් කර්මාන්තායතන ක්ෂේත්‍ර නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ. මෙම වැඩ සටහන උක් අභිජනන හා ශෂ්‍ය විද්‍යා අංශයන්හි සහාය ඇතිව ආර්ථික විද්‍යා හා ව්‍යාප්ති අංශය විසින් සංවිධානය කෙරුණි.

ඉහත දැක්වූ ක්ෂේත්‍ර දින වැඩසටහනේ විශේෂත්වය වූයේ ගොවිමහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් නව උක් ප්‍රභේද ඇගයීමකට ලක් කිරීමයි. මේ සඳහා සහභාගී වූ ගොවි මහත්ම මහත්මීන් කණ්ඩායම් වශයෙන් වර්ෂාපෝෂිත තත්ව යටතේ වගාකළ නව උක් ප්‍රභේද 8ක් ක්ෂේත්‍රය තුළදී පරීක්ෂා කර පඳුරුවල පෙනුම, පඳුරක ඇති ගස් සංඛ්‍යාව, භූමිය ආවරණය වීම ආදී ලක්ෂණ අධ්‍යයනය කරමින් තම අදහස් ඉදිරිපත් කළහ. ඔවුන්ගේ සමස්ථ ඇගයුම අනුව ඉදිරියේදී හඳුන්වා දීමට යෝග්‍ය ලක්ෂණ පෙන්වන එස් එල් 92-4918 එස් එල් 92-4997 ඉහළම තේරීම වූ අතර දැනට මෙතෙක් ගොවීන් අතර ජනප්‍රියව පවතින සී.ඕ. 775 ප්‍රභේදයට තුන්වන ස්ථානය ලබා දී තිබුනි.



වැඩසටහනට සහභාගිවූ ගොවි මහත්ම මහත්මීන් නව උක් ප්‍රභේද අධ්‍යයනය කරමින්...

# උක් පර්යේෂණ ආයතනය අඩු වියදම් උණුදිය ප්‍රතිකාර යන්ත්‍රයක් නිපදවයි



නව උණුදිය ප්‍රතිකාර යන්ත්‍රය

බීජ උක් උණු දිය ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය කුඩා පරිමාන උණු දිය ප්‍රතිකාර යන්ත්‍රයක් නිපදවීමට උක් පර්යේෂණ ආයතනයේ ඉංජිනේරු අංශය සමත් වේ. දැනට වසංගත තත්වයෙන් ව්‍යාප්ත වීඇති සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝග පාලන කටයුතු සඳහා නිරෝගී බීජ උක් භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා මූලික තවාන් වල සිටුවීමට අවශ්‍ය බීජ උක් උණු දිය ප්‍රතිකාර කල යුතු අතර ඒ සඳහා දැනට සෙවනගල හා පැල්වත්ත සීනි සමාගම් වල භාවිතා කරන උණු දිය ප්‍රතිකාර යන්ත්‍ර මගින් එම කාර්ය හරියාකාරව සිදු නොවන අතර වියදමද අධිකවේ. මෙම කරුණු ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගෙන අඩු වියදම් සුළු පරිමාන උණු දිය ප්‍රතිකාර යන්ත්‍රයක් නිපදවීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. දැනට උක් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුකූලව දිනකට උක් ටොන් එකක් පමණ මේ මගින් ප්‍රතිකාරයට ලක් කල හැක. මූලික වශයෙන් විද්‍යාගාර මට්ටමේ සුළු පරිමාණ උණු දිය ප්‍රතිකාර අවශ්‍යතාවන් සඳහා නිමවා භාවිතයට ගෙන ඇති ඇති මෙම යන්ත්‍රය ඉදිරියේදි වාණිජ මට්ටමේ අවශ්‍යතා සඳහා සුළු පරිමාණ යන්ත්‍රයක් ලෙස ගොවීන්ට හඳුන්වා දීමට බලාපොරොත්තුවේ.

## ආයතන තොරතුරු

### ආචාර්ය ධර්මවර්ධන විශ්‍රාම යයි

උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වශයෙන් වසර 20ක් පමණ සේවය කළ ආචාර්ය එන්. ධර්මවර්ධන මහතා 2005 පෙබරවාරි මාසයේ සිට සිය සේවා කාලය අවසන් කර විශ්‍රාම ගියේය. කැළණිය විශ්ව විද්‍යාලයෙන් සිය මූලික උපාධියත්, එක්සත් රාජධානියේ ඩන්ඩි විශ්ව විද්‍යාලයෙන් ජීව රසායන විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධියත් ලබා ශ්‍රී ලාංකීය හා එතෙර විශ්ව විද්‍යාල කිහිපයක ආචාර්ය වරයෙකු ලෙස කටයුතු කිරීමෙන් අනතුරුව 1983 දී උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වශයෙන් සේවයට එක් විය. ආයතනය කන්තලේ සිට උඩවලව ප්‍රදේශයේ ස්ථාපනය කර ඔස්ට්‍රේලියාව හා ජපානය ආදී රටවලින් ආධාර ලබාගනිමින් වර්තමාන තත්වයට දියුණු කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇති ආචාර්ය එන්. ධර්මවර්ධන මහතා ආනයනික සීනි මත සෙස් බද්දක් පැනවීමට අවශ්‍ය කටයුතු කිරීම මගින් ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීමටද මූලික වී කටයුතු කළේය. සිය සේවයේ අවසාන කාලයේදී සීනි සඳහා ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කිරීමට හා සීනි කර්මාන්තය සංවර්ධනය සඳහා මූලිකත්වය ගනිමින් අමාත්‍යංශ සමග එක්ව කටයුතු කළේය.

### පර්යේෂණ හා අනෙකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට පියවර

උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ දිගුකලක් නොපියවා පැවති තනතුරු පුරප්පාඩු මෙම වසර තුළදී පිරවීමට කටයුතු කිරීම හේතුවෙන් මෙතෙක් අකර්මණ්‍යව පැවති විෂයන්ට අදාල පර්යේෂණ කටයුතු නැවත ඇරඹීමට හැකි වී ඇති අතරම පරිපාලන කටයුතු සම්බන්ධව සේවක හිඟයන්ටද පිළියම් ලැබීමෙන් ආයතනයේ වැඩකටයුතු විධිමත්ව ඉදිරියට ගෙනයාමට අවස්ථාව උදාවී ඇත. මේ අනුව පර්යේෂණ නිලධාරීන් අට දෙනෙක් පසුගිය කාල සීමාවේදී පර්යේෂණ කාර්ය මණ්ඩලයට අලුතින් එකතුවිය.

# උක් වගාවේ සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝග පාලනය සඳහා දැනට නිර්දේශිත ක්‍රියාමාර්ග යළි අවධාරණයට



සුදු පත්‍ර රෝගය වැළඳුනු උක් පඳුරක්

සුදු පත්‍ර/ තෘණාකාර කුරුවීමේ රෝග පාලනය කිරීම සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහන් මෙන්ම දැනට නිර්දේශිත රෝග පාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ අවශ්‍යතාවය පසුගිය අගෝස්තු 05 දින උක් පර්යේෂණ ආයතනයේදී පැවති සුදුපත්‍ර රෝග පාලන කමිටු සාකච්ජාවේ විශේෂ අවධානය යොමු විය. සුදුපත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝග වල වර්තමාන තත්වය අධ්‍යයනය කර රෝග පාලන කටයුතු සැලසුම් කිරීමට උක් පර්යේෂණ ආයතනයේ හා උක් කර්මාන්තායතන නියොජිත මහතුන් හා රෝග හා පළිබෝධ සම්බන්ධ සම්පත් දායක යන්ගේ මූලිකත්වයෙන් පිහිටවනු ලැබූ සුදුපත්‍ර රෝග පාලන කමිටුව එහිදී වැඩි දුරටත්, රෝග වාහක කෘමි විශේෂය මර්දනය කිරීමේ ක්‍රම අධ්‍යයනය කිරීම, රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේද වැඩි දියුණු කිරීම, බීජ ප්‍රතිකාර කිරීමේ තාක්ෂණය දියුණු කිරීම, බීජ උක් සහතික කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම හා රෝග පාලනය සම්බන්ධ ව්‍යාප්ති කටයුතු අදාලව ඉදිරියේ දී ගතයුතු ක්‍රියාමාර්ග සැළසුම් කිරීම ඇතුළු ඉදිරි වැඩසටන් සකසන ලදී.

පහත සඳහන් නිර්දේශිත රෝග පාලන ක්‍රියාමාර්ග සියළුම උක් වගා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු බව අවධාරණය කරන ලදී.

## සුදු පත්‍ර/ තෘණාකාර කුරුවීමේ රෝගය පාලනය සඳහා උක් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත ක්‍රියාමාර්ග

1. නව වගාවක් සඳහා සෑම විටම රෝගයට ඔරොත්තුදෙන ප්‍රභේදයකින් නිරෝගී උක් බීජ ලබා ගැනීම. මේ සඳහා එස් එල් 83-06 ප්‍රභේදය නිර්දේශ කෙරේ (නිරෝගී උක් බීජ ලබාගන්නා අන්දම පහත දැක්වේ).
2. වගාව නිරතුරුවම නිරීක්ෂණය කොට රෝගී ශාක ගලවා පුළුස්සා දැමීම
3. පැල වගාවක රෝග ප්‍රතිශතය 30% ඉක්මවන්නේ නම් වගාව විනාශ කොට අවම වශයෙන් මාස 03 ක් වත් පුරන් කර නිරෝගී උක් බීජ මගින් නැවත වගාව ඇරඹීම.
4. ද්විතියික ආසාධනයක් ඇති විට හැකි ඉක්මනින් අස්වනු නෙලීම හා තවදුරටත් නිරි වගා පවත්වා ගෙන නොයෑම.

## නිරෝගී බීජ උක් නිපදවීමේ නිර්දේශිත ක්‍රියාමාර්ග

### තවාන් බිම

බීජ උක් තවානට භාවිතා කරන බිම අනෙකුත් ප්‍රධාන වගා වලින් අවම වශයෙන් කිලෝමීටර් 01 ක් වත් ඈතින් පිහිටිය යුතුය. එසේම ජලය සපයා ගත හැකි සරු බිමක් විය යුතුය.

### මූලික තවාන සඳහා බීජ උක් සැකසීම

මාස 10-12 පමණ වන සරුවට වැඩුනු පෙනුමක් ඇති නිරෝගී උක් වගාවකින් තවානට අවශ්‍ය බීජ උක් දඬු ලබාගත යුතුය. මෙම උක් දඬු නිර්දේශිත ආකාරයට පුරුක් 3 කැබලි වලට කපාගෙන



රෝගී උක් පඳුරක් ගලවා ඉවත් කරන අයුරු

## මැදමුලන පොල් තවාන් භූමියේ පැවති උක් පර්යේෂණ ආයතන ප්‍රදර්ශන කුටියේ විවිධ අවස්ථා









ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා , ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා සහ ගරු නියෝජ්‍ය වැවිලි කර්මාන්ත අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් මැදමුලන පොල් තවාන් භූමියේ පැවති උක්පර්යේෂණ ආයතන ප්‍රදර්ශන කුටිය නරඹමින්

සෙ.ශ්‍රේ. $54^0$ උෂ්ණත්වයේ මිනිත්තු 50ක් ගිල්වා ප්‍රතිකාර කළ යුතුය.

උණුදිය ප්‍රතිකාර කළ උක් දඬු කැබලි සංස්ථානික දිලීර නාශකයක ගිල්වා තැබිය යුතුය. මේ සඳහා බෙොලිකර් නැමති දිලීර නාශකයේ 0.05% ද්‍රාවනයක මිනිත්තු 30 ක් පමණ ගිල්වා තැබීම නිර්දේශ කෙරේ (ප්‍රතිකාරයට පෙර හා පසුව උක් දඬු වල අංකුර වලට හානි නොවීමට වග බලා ගත යුතුය).

### ප්‍රාථමික තවානේ සිටුවීම හා මතුවන රෝගී පැල ඉවත් කිරීම

සැකසූ බීජ උක්, තවාන් බිමේ හැකි ඉක්මනින් සිටුවිය යුතුය. පැළ මතුවන අවස්ථාවේ සිට වගාව නිරන්තර අවධානයට යොමුකොට රෝගී පැල තිබේනම් ඒවා ගලවා පුලුස්සා දැමිය යුතුය.

### රෝග වාහක කෘමීන් මර්දනය සඳහා කෘමිනාශක ඉසීම

අවම වශයෙන් සති දෙකකට වරක්වත් සංස්ථානික කෘමිනාශකයක් ඉසිය යුතුයි. මේ සඳහා ඩයිමිතොඒට් නැමති කෘමිනාශකය නිර්දේශ කෙරේ (0.001 % ඩයිමිතොඒට් ජලීය ද්‍රාවණයකින්, පැළ වගාවක හෙක්ටයාර් 1 ක් සඳහා ලිටර් 450ක් ද, වැඩුනු වගාවක් සඳහා ලීටර් 650 ක් ද නිර්දේශ කොට ඇත).

### වල් මර්ධනය හා අනෙකුත් වගා පාලන ක්‍රියාවන් නිසි පරිදි කිරීම

### මූලික තවානෙන් ලබාගත් බිජ ද්විතීක තවානක සිටුවීම

ඉහත ආකාරයට නඩත්තු කළ තවානට මාස 07 ක් පමණ වන විට අස්වනු නෙලා එම උක් දඬු බීජ ලෙස ගෙන මූලික තවානේ පරිදිම ද්විතීක තවාන ඇති කළ යුතුය. නමුත් මෙහිදී බිජ උණු දිය ප්‍රතිකාර කිරීම අවශ්‍ය නොවේ.

එම තවානද ඉහත දක්වා ඇති පරිදිම හොඳින් පාලනය කළ යුතුය (කෘමිනාශක යෙදීම හා වල් මර්දනය අත්‍යඅවශ්‍ය වේ).

### වානිජ වගාව සඳහ බීජ උක් ලබා ගැනීම

ද්විතීක තවානට මාස 07 ක් පමණ වන විට අස්වනු නෙලා වානිජ වගාවන් සඳහා බීජ උක් ලබාගත හැක.

# සීනි නිෂ්පාදනය පිළිබඳ වර්තමාන තොරතුරු

## ශ්‍රී ලංකාවේ උක් සීනි නිෂ්පාදනය පිළිබඳ දත්ත (2004)

| | |
|---|---|
| <u>මුළු උක් වගාව බිම් ප්‍රමාණය (හෙක්ටයාර)</u> | – 9039 |
| ඇඹරූ උක් ප්‍රමාණය(<u>(මෙට්‍රික් ටොන්)</u> | – 663000 |
| සාමාන්‍ය උක් අස්වැන්න <u>(හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්)</u> | – 62 |
| සීනි නිෂ්පාදනය <u>((මෙට්‍රික් ටොන්)</u> | - 58000 |
| සීනි උකහා ගැනීම (%) | - 8.8 |

## පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ උක් සීනි හා අතුරු නිෂ්පාදන දත්ත 2004/2005

| | |
|---|---|
| <u>උක් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)</u> | |
| කේන්ද්‍රීය | 1,683 |
| ජනාවාස | 2,684 |
| පිටස්තර ගොවි | 6,652 |
| එකතුව | 11,019 |
| <u>අස්වැන්න නෙලූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)</u> | |
| කේන්ද්‍රීය | 1,712 |
| ජනාවාස | 2,546 |
| පිටස්තර ගොවි | 5,780 |
| එකතුව | 10,038 |
| <u>මුළු උක් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)</u> | |
| ISFO | 20,167 |
| ජනාවාස | 114,422 |
| පිටස්තර ගොවි | 242,812 |
| හිඟුරාන | 23,337 |
| එකතුව | 470,318 |
| <u>සාමාන්‍ය උක් අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්)</u> | |
| කේන්ද්‍රීය | 36 |
| ජනාවාස | 45 |
| පිටස්තර ගොවි | 42 |
| සීනි නිෂ්පාදනය (<u>මෙට්‍රික් ටොන්</u>) | 40,151 |
| සීනි උකහා ගැනීම (%) | 8.54 |
| මුළු ඉක්ෂුපාක නිෂ්පාදනය (<u>මෙට්‍රික් ටොන්</u>) | 23,093 |
| මුළු ස්ප්‍රීතු නිෂ්පාදනය (ලීටර්) (Bulk ltrs) | 4,461,313 |

## සෙවනගල සීනි කර්මාන්තායතනයේ උක් සීනි සහ අතුරු නිෂ්පාදන දත්ත 2004

| | |
|---|---|
| <u>උක් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)</u> | |
| වාරි පෝෂිත | 1,621 |
| වර්ෂා පෝෂිත | 1,768 |
| කේන්ද්‍රීය | 234 |
| එකතුව | 3,623 |
| <u>ඇඹරූ උක් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)</u> | |
| වාරි පෝෂිත | 155,026 |
| වර්ෂා පෝෂිත | 151,926 |
| කේන්ද්‍රීය | 19,943 |
| එකතුව | 326,895 |
| <u>මුළු උක් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)</u> | |
| වාරි පෝෂිත හා වර්ෂා පෝෂිත | 265,007 |
| පිටස්තර ගොවි | 1,489 |
| එකතුව | 266,496 |
| <u>සාමාන්‍ය උක් අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්)</u> | |
| වාරි පෝෂිත | 88.8 |
| වර්ෂා පෝෂිත | 74.0 |
| සීනි නිෂ්පාදනය (<u>මෙට්‍රික් ටොන්</u>) | 23,000 |
| සීනි උකහා ගැනීම (%) | 8.57 |
| මුළු ඉක්ෂුපාක නිෂ්පාදනය (<u>මෙට්‍රික් ටොන්</u>) | 9,120 |
| මුළු ස්ප්‍රීතු නිෂ්පාදනය (ලීටර්) (Bulk ltrs) | 2,597,660 |
| ස්ප්‍රීතු අලෙවි කිරීමෙ මිල (ලීටරයට රුපියල්) | 77.50 |

## දේශීය සීනි නිෂ්පාදනය, සීනි ආනයන ප්‍රමාණ, ආනයන වියදම හා ඒක පුද්ගල සීනි පරිභෝජනය (1998 - 2004)

| අවුරුද්ද | දේශීය සීනි නිෂ්පාදනය (මෙ.ටො) | ආනයන සීනි ප්‍රමාණය (මෙ.ටො) | ආනයන වියදම (රු. මිලියන) | ඒක පුද්ගල පරිභෝජනය කිග්‍රෑ |
|---|---|---|---|---|
| 1998 | 61540 | 444000 | 8384 | 30.57 |
| 1999 | 65220 | 479000 | 7488 | 32.18 |
| 2000 | 64000 | 562000 | 10777 | 32.38 |
| 2001 | 48000 | 420000 | 10289 | 33.18 |
| 2002 | 38000 | 554000 | 12634 | 34.12 |
| 2003 | 57000 | 509000 | 11199 | 34.82 |
| 2004 | 58000* | 438000 | 11048 | 35.12 |

* තාවකාලික

(දත්ත මූලාශ්‍රයන් : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, F.O.Lichts,සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්තායතන)

# ස්ටීවියා (Stevia)
# 21 වන සියවසේ සීනි පැළෑටිය

සීනි පරිභෝජනය හේතුවෙන් ඇති විය හැකි රෝගයන්ගෙන් මිදී ස්වභාවික පැණිරස භුක්ති විඳීමේ වරමක් ලැබීමට හැකිනම්, එය බොහෝ අයට ඉතාමත් ප්‍රීති ජනක ආරංචියක් වනු නොඅනුමානය. නමුත් 21 වන සියවසේ ජීවත් වන අප ට එම අවස්ථාව ඉතාම මැතකදී හිමිවන ලකුණු ස්ටීවියා නැමති පැළෑටිය සම්බන්ධයෙන් ඉන්දියාවෙන් වාර්තා වී ඇති කරුණු අනුව පෙනේ. ස්ටීවියා උක් සීනි හා බීට් සීනි වලට වඩා 20-30 ගුණයක පැණිරසක් ඇති පෝෂ්‍ය ගුණයෙන් අනූන, විෂ රහිත රසවත් ඖෂධීය පැළෑටියකි. කාබෝහයිඩ්‍රේට හා මේදය නොමැති කැලරි රහිතව පැණි රස සැපයීමට හැකි මෙම ස්ටීවියා පැළෑටිය හෙට දින ලෝකයේ සීනි සඳහා එක් ස්වාභාවික විකල්පයක් ලෙස සංවර්ධනය කිරීමට අපේ අසල් වැසි ඉන්දියාව දැනටමත් පියවර ගෙන ඇත.

අතීතයේ පටන් පැරගුවේ දේශයේ ගුරාන්ටි ගෝත්‍රිකයින් කොළ තේ පානය හා අනෙකුත් ගෘහ අවශ්‍යතා සඳහා භාවිතා කරමින් පවතින මෙම පැළෑටිය වර්තමානයේ ජපානය, බ්‍රසීලය, ඇමෙරිකා එක්සත් ජනපදය, ආජන්ටිනාව, චීනය, කැනඩාව, පැරගුවේ හා ඉන්දුනීසියාව අදී රටවල භාවිතා වේ. එසේම මෙම පැළෑටිය වානිජ වගාවක් ලෙස වැඩි දියුණු කිරීමට අවශ්‍ය දේශගුණික හා පාංශු තත්ත්ව හා වගා පාලන කටයුතු අධ්‍යයනය කර ඇති ඉන්දිය පැළෑටි පර්යේෂණ හා ඉඩම් සංවර්ධන මධ්‍යස්ථානය කාබනික වගාවක් ලෙස ඉන්දියාව තුළ ස්ටීවියා ප්‍රචලිත කිරීමට කටයුතු කරමින් සිටී.


ස්ටීරියා පැළෑටි

දකුණු ඇමරිකාවේ පැරගුවේ දේශය නිජබිම කරගත් කොම්පොසිටේ පවුලට අයත් බහුවාර්ෂික පැළෑටියක් වන ස්ටීවියා, බීජ, පටක රෝපනය හා වර්ධක ප්‍රචාරණය මගින් පැල කරගත හැකිය. මීටර් 200-500 පමණ උස , මධ්‍යන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් 23 (- 6 C + 43C පරාසය) හා වාර්ෂික වර්ෂාපතනය මි. මී. 1500 - 1800 පමණ තත්ව සහිත පැරගුවේ දේශයේ අඹම්බේ කඳු ප්‍රදේශයේ පිහිටි රියෝ මන්ඩේ නිම්නයේ මෙම බෝගය හොඳින් වැවී ඇති බව වාර්තා වේ.

මෙම පැළෑටියේ ඇති ස්ටෙවියොල් ග්ලයිකොසයිඩ්ස් (steviol glycosides) මගින් පැණි රස උපදවයි. ස්ටීවියා විවිධ ආකාරයට භාවිතා කළ හැකි අතර භාවිතා කරන ආකාරය අවශ්‍ය පැණිරස ප්‍රමාණය අනුව රඳා පවතී. අලුත් හෝ වියළි ස්ටීවියා පත්‍ර කෙළින් ම හෝ ඒවායින් උකහා ගත් සුදු කුඩක් හෝ ද්‍රව සාන්ද්‍රණයක් ලෙස ද මෙය භාවිතා කල හැකිය. මේ එක් එක් ආකාරය අනුව එහි පැණි රස ප්‍රමාණයද වෙනස් වේ. ස්ටීවියා වියළි පත්‍ර ඉතා සියුම්ව කුඩු කර ගත් විට එහි එක් තේ හැන්දක් සීනි කෝප්පයක ඇති පැණි රසයට සමානවේ.

ස්ටීවියා රස කාරකයක්, ආහාර දිරවීමමේ උත්තේජකයක්, ප්‍රති ඔක්සිකාරකයක්, ප්‍රති රුධිර කැටිකාරකයක් ප්‍රති ජීවකයක්, ලෙසද ප්‍රයෝජනයට ගත හැකිය. එසේම, බර අඩු කිරීමට, දන්ත කුහර වැලක්වීමට, මානසික ඒකග්‍රතාව වැඩි කිරීමට මෙන්ම රුධිර සීනි ප්‍රමාණය වැඩිකිරීමකින් තොරව ශක්ති මට්ටම වැඩි කරන ස්ටීවියා දියවැඩියා ලෝකයට ප්‍රධාන පැණි රස කාරකයකි. මේ හැරුණු විට ස්ටීවියා අධි රුධිර පීඩනය, Hypoglcemic , සමේ ඉරි තැළීම සුව කිරීමට උදව් වීම, හා දුම් කොළ හා මධ්‍යසාර ලොල්බවට, tonic for pancreas, ආදිය සඳහා ද භාවිතා කළහැකි අතරම ආහාර කර්මාන්ත, බේකරි, පළතුරු බීම හා ජෑම් ආදි කර්මාන්ත සඳහා විකල්ප පැණි රස කාරකයක් ලෙසද යොදාගත හැකිය.



---

*මෙම පැළෑටිය සතු ඖෂධිය වටිනාකම මෙන්ම සීනි සඳහා විකල්පයක් ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව මෙන්ම ඉන්දියාව තුළ මේ සම්බබන්ධව ක්‍රියාත්මක වැඩ සටහන් අශ්‍රිතව එස්. ඩි. සිං හා පී.පී.රාවෝ Sugar Tech සඟරාවට සපයා ඇති ලිපියකින් මෙම කරුණු අනාවරණය කර ඇත).*

# පොල් වගාව තුළට උක් වගාව.........................



උක් පර්යේෂණ ආයතනයේ සභාපති තුමා විසින් උක් පැළ බෙදාදිමේ උත්සවයට පැමිනි වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා පිළිගනිමින්

උක් වගාව කුරුණෑගල ප්‍රදේශයේ පොල් වගාව තුල ව්‍යාප්ත කිරීමේ වැඩ සටහනේ මූලික පියවරක් ලෙස තම ගෙවතුවල වගා කිරීම සඳහා ප්‍රදේශයේ ජනතාව අතර උක් පැල බෙදා දීම ගරු වැවිලි කර්මාන්ත ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා අතින් පසුගිය දින පොල් සංවර්ධන මණ්ඩලයේ මහයාය වතුයායේදී සිදු කෙරුණි. පොල් වගාවන් ආශ්‍රිත යටි වගාවක් වශයෙන් හා සුළු පරිමාණ වගා බිම් වශයෙන් උක් වගාව ව්‍යාප්ත කිරීමට හා ඒ මගින් ග්‍රාමීය උක් අශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය පසුගිය වසරේ සිට උක් පර්යේෂණ ආයතනය හා පොල් සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව පවත්වාගෙන යන ලදී. මේ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට පවත්වාගෙන යන අත්හදා බැලීම් අනුව එම ප්‍රදේශයට වඩාත් යෝග්‍ය වියහැකි බවට හඳුනාගෙන ඇති එස් එල් 83-06 උක් ප්‍රභේදය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා මහයාය පුදේශයේ උක් තවාන බිම ස්ථාපනය කිරීමේ අවස්ථාවට සමගාමීව උක් පර්යේෂණ ආයතනය හා පොල් සංවර්ධන මණ්ඩලය විසින් මෙම උත්සවය සංවිධානය කර තිබුනි.



මෙහිදී දැනට තනි වගාවන් ලෙස පොල් වැවීමට වඩා පොල් සමග වෙනත් අතුරු බෝග වගා කිරීම ආර්ථිකමය වශයෙන් වාසිදායක බැවින් ඒ සඳහා යොදාගත හැකි එක් බෝගයක් ලෙස උක් වගාව ව්‍යාප්ත කිරීමට පියවර ගතහැකි බවත් ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ වැවිලි කර්මාන්ත අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා උත්සව සභාව අමතමින් ප්‍රකාශ කලේය. එහිදී තව දුරටත් අදහස් දක්වමින් ගෘහස්ත කර්මාන්ත ලෙස උක් වගාවන් යොදා ගැනීමට අවශ්‍ය තාක්ෂණයන් ඉන්දියාව ආදි රටවල භාවිතා වන බවත් එම තාක්ෂණයන් යොදා මෙම ප්‍රදේශයේත් උක් ආශ්‍රිත ග්‍රාමිය කර්මානත ඉදිරියේදී දියුණු කලහැකි බවත් ඒ මහතා පෙන්වා දුනි. මෙම උත්සවයට උක් පර්යේෂණ ආයතනයේ සභාපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා පොල් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමා ඇතුලු නිලධාරි මහතුන් හා ප්‍රදේශවාසීන් සහභාගී විය.



ඔබගේ අදහස්, යෝජනා විවේචන හා ලිපි පහත ලිපිනයට යොමුකරන්න:


සංස්කාරක,
පුවත් හසුන,
උක් පර්යේෂණ ආයතනය,
උඩවලව

දු.ක. 047 2233233, 2233285, 2233281
ෆැක්ස්: 047 2233233
විද්‍යුත් තැපැල: sri@belmail.lk



**විෂය උපදේශකත්වය**
කේ. ශන්මුගනාදන්
ආචාර්ය එච්. කේ. සුනිල්
ආචාර්ය ජී. චන්ද්‍රසේන
ආචාර්ය ඒ. පී. කීර්තිපාල
ආචාර්ය ඩබ්. ආර්. ජී. විතාරම
ජේ. ඒ. යූ. ටී.සෙනෙවිරත්න

**සංස්කරණය සහ පිටු සැකසුම**
එම්. එස්. පෙරේරා

**පරිගණක සහාය**
බී. පී. ජී. සන්දනායක